## තොරතුරු නිදහස නැති තැන ?

පූර්ව යුද සමයේ සහ පශ්චාත් යුද සමයේ මානුෂවාදී පුවත් වාර්තාකරණයේ වෙනස ගැන කතා කරන විට පැහැදිලි කර ගත යුතු දෙයක් තිබේ. පූර්ව යුද සමය යනුවෙන් සමහර විට වචන භාවිතා වුවද අප කතා කරන මාතෘකා අදාල වන්නේ යුද්ධය පැවැති කාලයේ වාර්තාකරණයටය. හේතුව, මැයි මස 18 වැනිදා සවස හමුදාපතිවරු ජනාධිපතිවරයාටත්, මැයි මස 19 වැනිදා ජනාධිපතිවරයා නිල වශයෙන් රටටත් අවසන් බවට ප්‍රකාශ කළ යුද්ධයට වසර දෙකකුත් මාස 10ක් ගත වී ඇත. එහෙයින් ඒ කාලය හා මැයි මස 20 වැනිදායින් ආරම්භ වන කාලය යුද්ධය පැවැති කාලය සහ පශ්චාත් යුද කාලය වශයෙන් සැලකීම වඩා පැහැදිලිය. අප මෙම පූර්විකාව තබන ලද්දේ අප විසින් මානුෂවාදී පුවත් නිරීක්‍ෂණය කිරීම ආරම්භ කරන ලද පසුගිය වසරේ ඔක්තෝබර් සිට 2009 මැයි 19 දක්වා කාලය හා සසඳා බලන විට එයින් පසු එළඹී ඇති කාලය තුළ යම් වෙනස්කම් පැහැදිලි කිරීම සඳහාය. සමහර විට සමහර මාධ්‍ය මානුෂීය පුවත් වාර්තාකරණයේ කිසියම් සුළු වෙනසක ප්‍රවණතාව පෙන්වන නමුත් රජය පාර්ශ්වයෙන් ඒවාට සුපුරුදු පරිදි විරෝධතා එල්ල වන ආකාරයද පසු ගිය සතියේ දක්නට ලැබිණ. මේ විරෝධතාව ආකාර දෙකකින් එල්ල වී තිබිණ. එක් විරෝධතාවක් පළ කර තිබුණේ ජාත්‍යන්තර මාධ්‍ය විසින් ශ්‍රී ලංකාවේ මානුෂවාදී ගැටළු සම්බන්ධයෙන් පළ කළ වාර්තා සම්බන්ධයෙන් රජයේ බලධාරීන් කිහිප දෙනෙකු කළ ප්‍රකාශ හරහාය. අනෙක් විරෝධතාව පළ කර තිබුණේ ඇසෝසියේටඩ් ප්‍රෙස් පුවත් සේවාවේ කොළඹ බියුරෝවේ ප්‍රධානී රවි නෙස්මාන්ගේ වීසා බලපත් දීර්ඝ කිරීම ප්‍රතික්‍ෂේප කර ඔහුට රටින් පිට වෙන්නට ඉඩ සැලසීමෙනි. එයට එම පුවත් සේවය සහ සිදු වීම සම්බන්ධයෙන් විරෝධතාව පළ කරන මාධ්‍ය නිදහස සඳහා පෙනී සිටින සංවිධාන දක්වන අදහස් අනුව එයට හේතුවද මානුෂවාදී පුවත් සම්බන්ධයෙන් වාර්තා කිරීමයි.

රවි නෙස්මාන්ගේ වීසා දිගු කිරීම ප්‍රතික්‍ෂේප කිරීමට හේතුව ඔහු කළ වාර්තාකරණයන් නොවන බව රජය අවධාරණය කළද මේ පුවත වාර්තා කිරීමේදී මූලාශ්‍ර කර ගත් අසෝසියේටඩ් පුවත් සේවයේ ජාත්‍යන්තර පුවත් අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කර්තෘවරයාද කියා ඇත්තේ එවැනි වාර්තාවක් හේතුව වන්නට ඇති බවය. ඇසෝසියේටඩ් පුවත් සේවය මේ සම්බන්ධයෙන් කර ඇති වාර්තාව ඉංග්‍රීසි පුවත්පත් දෙකක් (ඩේලි මිරර්, අයිලන්ඩ්) දෙමළ පුවත්පතක් (සුඩර් ඔලි) සහ එක් සිංහල පුවත්පතක් (දිවයින) පළ කොට ඇත. එම පුවත සඳහා මූලාශ්‍ර කර ගෙන ඇති ජනාධිපති කාර්යාලයේ ජාත්‍යන්තර මාධ්‍ය අධ්‍යක්‍ෂ ලූෂන් රාජකරුණානායක මහතා පවසා ඇත්තේ රජයේ නීති ප්‍රකාරව එය සිදු වී ඇති බවයි. විදේශ මාධ්‍යවේදීන්ට වසර දෙකක් සඳහා වීසා ලබා දෙන අතර තුන් වැනි වසර සඳහා ඉල්ලූ විට එය ප්‍රතික්ෂේප කර ඇත්තේ රජය ඒ සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරයට අනුව යැයි පවසා ඇත. ඔහු එසේ ප්‍රකාශ කළද රවි නෙස්මාන්ට පෙර එම පුවත් සේවයේ ප්‍රධානියා 1997 සිට 2007 දක්වා වසර 10ක් ශ්‍රී ලංකාවේ සේවය කළ බව අසෝසියේටඩ් පුවත් සේවය වාර්තාවට එක් කර ඇත. කෙසේ වෙතත් මෙම මූලික කරුණු ඉහත කී පුවත්පත් තුනම සිය වාර්තාවට ඇතුළත් කර ඇති අතර දෙමළ පුවත්පත එහි සඳහන් තවත් කරුණු එක් කර ඇත. ඒ අනුව පසු ගිය වසරේ අවම වශයෙන් ශ්‍රී ලංකාවේ විදේශීය පුවත් සේවා වාර්තාකරුවන් 11 දෙනෙකුට රටින් පිට වීමට සිදු වී ඇති බවත්, 2006 සිට මාධ්‍යවේදීන් 14ක් ඝාතනය කර ඇති බවත් එහි සඳහන් වේ. සිදු වීම හෙළා දකිමින් දේශ සීමා රහිත මාධ්‍යවේදීන්ගේ සංවිධානය නිකුත් කළ නිවේදනයක්ද ඉහත කී දෙමළ පුවත්පත පළ කර ඇත. විදේශ මාධ්‍යවේදීන්ට වසර දෙකකට වඩා ශ්‍රී ලංකාවේ සිටීමට අවසර නැති බවට ලූෂන් රාජකරුණානායක මහතා කර ඇති ප්‍රකාශය ගැන සඳහන් කරන එම සංවිධානය තමන් එවැනි නීතියක් ගැන කිසිදා අසා නැතැයි ප්‍රකාශ කරයි. එම නිවේදනයට අනුව අවම වශයෙන් විදේශීය වාර්තාකරුවන් අට දෙනෙකුට 2009 වසරේ ජනවාරි සිට මේ දක්වා රටින් පිටවීමට සිදු වී ඇති බවත්, 2008 වසරේ සිට ජීවිත තර්ජන නිසා ශ්‍රී ලාංකික මාධ්‍යවේදීන් තිස් දෙනෙකුට පමණ රටින් පිට වීමට සිදු වී ඇති බවත් වාර්තා වේ. ඇසෝසියේටඩ් පුවත් සේවයේ වාර්තාව සහ දේශ සීමා රහිත මාධ්‍යවේදීන්ගේ වාර්තාව අතර රටින් පිට වීමට සිදු වූ මාධ්‍යවේදීන්ගේ සංඛ්‍යා ගැන වෙනසක් මෙහිදී දැකිය හැකිය.

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

විශේෂය වන්නේ සිංහල පුවත්පතේ පළ වූ වාර්තාවය. අනෙක් පුවත්පත් තුනම මාධ්‍යවේදියාගේ වීසා ප්‍රතික්ෂේප කිරීම සිරස්තලය ලෙස සඳහන් කර ඇතත් සිංහල පුවත්පතේ සිරස්තලය වන්නේ ''අවතැන් කඳවුරු හිට්ලර්ගේ වධ කඳවුරුවලට සමාන කළ මාධ්‍යවේදියා මෙරටින් යවයි'' යන්නය. ''විසි දහසකට අධික ද්‍රවිඩ ජනතාවක් ශ්‍රී ලංකාවේදී සමූල ඝාතනය වී ඇති බවට ලොව පුරා සාවද්‍ය තොරතුරු ප්‍රචාරය කළ විදේශ මාධ්‍යවේදියකු වූ රවි නෙස්මන් නමැත්තා තව දුරටත් මෙරට රැඳී සිටීමට කළ ඉල්ලීම රජය ප්‍රතික්ෂ්ප කිරීම නිසා ඊයේ (22) රටින් පිටව ගොස් ඇති'' යනුවෙන් පුවතේ මුල් ඡේදය වාර්තා කරන්නේ තම මතයද එක් කරමිනි. අනෙක් පුවත්පත් යොදා ගත් මූලාශ්‍ර කිසිවක් මෙහි නැති අතර විසිදාහක් මිය ගිය බවට එක්සත් ජාතීන්ගේ සාවද්‍ය වාර්තාවක් සපයා ඇත්තේ මොහු විසින් බවට බුද්ධි අංශ සොයා ගෙන තිබූ බව අවසානයට කියයි. වාර්තාව ඍජුවම මාධ්‍යවේදියාට එරෙහි ස්ථාවරයක් ගනී.

කෙසේ වෙතත් මෙම සිදු වීමට හේතුව ලෙස සියළු පාර්ශ්වවලින් පැහැදිලි වන්නේ මානුෂවාදී පුවත් වාර්තාකරණයයි. ඊට අමතරව ඉහතින් සඳහන් කළ ආකාරයට රජයේ බලධාරීන්ට විරෝධතාව පළ කරන්නට සිදුවූ වාර්තාවලටද හේතුව මානුෂවාදී පුවත් වාර්තා කරණයයි. ඒවා ද ජාත්‍යන්තර මාධ්‍යවල පළ වූ වාර්තා එල්ල කර ගත් ඒවාය.

මෙවර මාධ්‍ය නිරීක්ෂණය කරන ලද්දේ ජූලි මස 20 සිට 26 දක්වා කාලය තුළ දින හයක පුවත්පත් 72ක් සහ රූපවාහිනී ප්‍රවෘතිත් විකාශන 5කි. එම කාලය තුළ රවි නෙස්මාන් ගැන පුවත පළ කර ඇත්තේ ඉහත කී පුවත්පත් හතර පමණි. තවත් එක් ඉරිදා පුවත්පතක (ඉරිදා ලංකාදීප) වාර්තාවකින් අප සඳහන් කළ කරුණු දෙකටම අදාල කර ගත හැකි චෝදනා රැසක් කරයි. ''එතෙර පුවත්පත් කියන කතා'' නම් විශේෂාංගයේ යුද්ධය විකුණා ගෙන කෑ ජාත්‍යන්තර ජන මාධ්‍ය යන උප සිරස්තලය යටතේ මුදල් ඉපයීම සඳහා ජාත්‍යන්තර මාධ්‍ය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු වාර්තා කරන බවට එම ලියුම්කරු චෝදනා කරයි. ශ්‍රී ලංකාවේ අවතැන් කඳවුරුවල සතියකට 1400ක් මිය යන බව ජූලි 9 වැනිදා ලන්ඩන් ටයිම්ස් පුවත්පත වාර්තා කර තිබූ බව, යුද්ධයේ අවසන් සති කිහිපයේදී සිවිල් වැසියන් විසිදාහක් මිය ගොස් ඇති බව 29 වැනිදා එය වාර්තා කළ බව, චැනල් 4 රූපවාහිනිය දිගටම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බොරු වාර්තා කරන බව, ආදී කරුණු රැසක් ලේඛකයා ඉදිරිපත් කරයි. එදා යුද්ධය ගැන බොරු ලියා දැන් අවතැන් වූවන් ගැන බොරු ලියන බවටද ඔහු චෝදනා කරයි. නිව්යෝර්ක් ටයිම්ස්, ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පත්ද එසේ බොරු ලියා ඇති බව කියයි. රජයේ බලධාරීන් විරෝධතාව පළ කර ඇත්තේද ජාත්‍යන්තර මාධ්‍ය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අසත්‍ය වාර්තා පළ කර ඇති බව දක්වමිනි.

අවතැන් කඳවුරුවල සිදුවන මරණ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මාධ්‍යවල පළ වූ වාර්තාවක් ප්‍රධාන වශයෙන් රජයේ බලධාරීන්ගේ අවධානයට ලක් වී ඇත. පළ වූ මාධ්‍ය ගැන සඳහන් නොවෙතත් එක් සිංහල පුවත්පත් වාර්තාවකින් (ලක්බිම) හෙළි වන්නේ මරණ අනුපාතය වැඩි කර දක්වා ඇති බවයි. ලංකාවේ අවතැන් කඳවුරුවල මරණ අනුපාතය සියයට 5.9ක් වන අතර ජාත්‍යන්තර අනුපාතය 6.2 සිට 13.2 දක්වා ඉහළ අගයක් ගන්නා බව ප්‍රකාශ කරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් අතුල කහඳලියනගේ මහතා ජූනි 10 සිට 18 දක්වා කාලය තුළ 1400ක් මිය ගොස් ඇතැයි වාර්තා කිරීම සම්පූර්ණ අසත්‍යයක් බව ප්‍රකාශ කර ඇත. එම කාලය තුළ මිය ගොස් ඇත්තේ 163ක් බවද ඔහු ප්‍රකාශ කර ඇත. මේ පුවතටම අදාලව අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා දැක්වූ අදහසක්ද තවත් සිංහල පුවත්පතක (දිනමිණ) සම්මුඛ සාකච්ඡාවක දැක්වේ. මේ කාරණය සම්බන්ධ කර ගෙන සෞඛ්‍ය ඇමැතිවරයා දැක්වූ අදහස දෙමළ පුවත්පත් දෙකක් (වීරකේසරී, තිනක්කුරල්) පළ කර ඇත්තේ ''අවතැන් කඳවුරුවල ජනතාව සංචාරක හෝටල්වල් තියන්න බැහැ'' යන සිරස්තලය යටතේය. මහින්ද සමරසිංහ අමාත්‍යවරයා ජාත්‍යන්තර මාධ්‍ය බොරු කියන බවට කළ ප්‍රකාශයද දෙමළ පුවත්පතක් (වීරකේසරී) වාර්තා කර ඇත. එක් ඉංග්‍රීසි පුවත්පතක්ද (ඔබ්සර්වර්) මහින්ද සමරසිංහ ඇමැතිවරයා කඳවුරුවල මරණ ගැන කළ පැහැදිලි කිරීමක් පළ කොට ඇත. ජාතික රූපවාහිනියේද මේ සම්බන්ධ පුවත් දෙකක් පළ විය.

කෙසේ වෙතත් රවි නෙස්මන්ගේ වීසා දිගු නොකිරීම හා ජාත්‍යන්තර මාධ්‍ය බොරු කියන බව ප්‍රකාශ කිරීම යන දෙකම මේ අනුව වැටෙන්නේ එකම ගොඩටය. එක් අතකින් වාර්තා වී ඇත්තේ මානුෂවාදී පුවත්ය. අනෙක් අතින් රජය කියන ආකාරයට ඒවා වැරැදිය. ලංකාවේ

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

සමහර මාධ්‍ය තවමත් රජයේ මූලාශ්‍ර හෝ වෙනත් මෘදු සිදුවීම් පාදක කොට ගෙන ඉතාම සුළු පියවරකින් මානුෂීය පුවත් ගැන ඉදිරියට යන්නට උත්සාහ කරන විට බරපතල පුවත් සොයා පළ කළ ජාත්‍යන්තර මාධ්‍ය ගැන විරෝධතා දක්වන පුවත් පළ කිරීමටද ඒවාට සිදු වී ඇත. මේ පළ වී ඇත්තේ අසත්‍යනම් එහි නිරවද්‍ය වාර්තාකරණය නැති බව සැබෑය. ඒවා අසත්‍යනම් සත්‍ය තොරතුරු මාධ්‍යවේදීන් සොයා ගන්නේ කෙසේද? තොරතුරු ලබා දීමට රජයේ ආයතන සූදානම්ද? මාධ්‍යවේදීන්ට හෝ තොරතුරු ලබා ගැනීමේ අයිතිය ඇති මහජනයාට හෝ එම තොරතුරු ලබා දීම සඳහා අදාල අයතන හා බලධාරීන්ට නීතියෙන් ඉඩක් නැතිනම් මාධ්‍යවේදීන්ට වාර්තා කිරීමට සිදු වන්නේ රහසිගතව දන ඇඳුනුම්කම්වල ප්‍රමාණයට ලබා ගන්නා තොරතුරු පමණද? තමන් විසින් ගවේෂණය කර තොරතුරු සොයා ගැනීමට නිදහසක් මාධ්‍යවේදීන්ට තිබේද? තොරතුරු ලබා ගැනීමේ නිදහස මෙන්ම තොරතුරු පළ කිරීමේ නිදහස මාධ්‍යවේදීන් ඉදිරියේ තිබෙනවාද? නැතිනම් තෝරා බේරා පෙරා රජය විසින් පොදුවේ බෙදා හරින තොරතුරු මත පමණක් ජනමාධ්‍යවේදීන් විශ්වාසය තබා සිටිය යුතුද? ඉහත කී සිදුවීම් ඔස්සේ මාධ්‍යවේදීන් ඉදිරියේ මෙවැනි ප්‍රශ්න ගණනාවක්ම මතු කරයි.

**සීතා රංජනී**

**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com